සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

## පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

### I පත්‍රය

### නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන "අදිති"

**5**

පැය 01 යි

විභාග අංකය ...............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පරිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**පහත දැක්වෙන රූප ඇසුරින් 1 - 2 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
|  දියකාවා **A** |  ගෙම්බා **B** |  වව්ලා **C** |  බකමූණා **D** |
|  සේරු **E** |  නූට්ටා **F** |  හාවා **G** |  උලමා **H** |

01. ඉහත රූප බාණ්ඩ කළ හැකි වඩා සුදුසු ක්‍රමය තෝරන්න.

i. A,C / E,D / B,F / H,G    ii. B,F /  A,E / C,G / D,H    iii. H,C / D,A / B,F / E,G

02. පිහිනීම, කිමිදීම, පියාඹීම යන ක්‍රියාවන් තුනම කළ හැකි සතුන් යුගලය වන්නේ,

i. A, E    ii. C, F    iii. D,H

03. කිසියම් හේතුවක් මත රූප දෙකක් එක් බාණ්ඩයකට ගත හැකි ය. එසේ එම බාණ්ඩයට දැමිය නොහැකි රූපය තෝරන්න.


i.


ii.


iii.

04.


i.


ii.


iii.

**5 - 6 ප්‍රශ්නවලට පහත දැක්වෙන කවිය ඇසුරින් පිළිතුරු සපයන්න.**

***මලක මලෙකි***
***මහ පුදුමෙකි***
***නැහැ එහි සකි***
***සමනළයෙකි***

05. කවියට අනුව මහ පුදුමය කුමක් ද?

i. මලක් උඩ සමනළයෙක් සිටීම. ii. මලක් උඩ කුරුල්ලෙක් සිටීම. iii. මලක් උඩ මලක් තිබීම.

06. යහළුවා යන පදයට සමානාර්ථ පදයක් කවියේ සඳහන් වේ. එය කුමක් ද?

i. සකි ii. පුදුමෙකි iii. සමනළයෙකි

07. පහත දැක්වෙන කොඩි වැඩි බටේ සිට අඩු බව දක්වා පෙළ ගැස්වීමට වෙනස් කළයුතු අවම කොඩි ගණන වන්නේ,



i. 4 ii. 3 iii. 2

08. පහත දැක්වෙන්නේ කුඩා ඝනක කැට දෙකකි. එය තරමක් විශාල ඝනකයක් සාදා ගැනීමට උවමනා අවම කුඩා ඝනක කැට ගණන කීයද?



i. 2 ii. 6 iii. 25

09. වෙළෙන්දෙක් අඹ ගෙඩි 6 ක් රුපියල් 100 ට ගෙන අඹ ගෙඩි 2 ක් රුපියල් 60 ට විකුණයි. වෙළෙන්දාට රුපියල් 400 ක ලාභයක් ලබා ගැනීමට විකිණිය යුතු අඹ ගෙඩි ගණන කීය ද?

i. 5 ii. 20 iii. 30

10. ක්‍රීඩාවක් සඳහා ළමයි පිරිසක් A සහ B ලෙස කණ්ඩායම් දෙකකට වෙන් කරන ලදී. A කණ්ඩායමේ මෙන් තුන් ගුණයක් B කණ්ඩායමේ සිටිති. A කණ්ඩායමට තවත් ක්‍රීඩකයෝ 10 දෙනෙක් පැමිණිය හොත් කණ්ඩායම් දෙකේම සිටින ළමුන් ගණන සොයන්න.

i. 6 ii. 20 iii. 30

11. පහත රූපයේ දැක්වෙන ආකාරයට කෙවින් තත්පරයට මීටර් 10 ක් ඉදිරියට ඇදෙන අතර, අයිස්ක්‍රීම් වෙළෙන්දා තත්පරයකට 5m ඉදිරියට ඇදෙයි. කෙවින්ට වෙළෙන්දා හමුවීමට තත්පර කීයක් ගතවේද?




i. තත්පර 10 ii. තත්පර 50 iii. තත්පර 20

12. ජානුගේ නිවසේ බිත්ති ඔරලෝසුවේ මිනිත්තු 5 ක් වැඩිපුර පෙන්වයි. එම ඔරලෝසුවේ වේලාවෙන් පෙරවරු 7.00 ට රැකියාවට යන ජානු රැකියා ස්ථානයේ ඔරලෝසුවෙන් වේලාව බලන විට එය පෙරවරු 8.20 ලෙස පෙන්වයි. නමුත් එම ඔරලෝසුව සැම විටම මිනිත්තු 10 ක් අඩුවෙන් පෙන්වයි. ඒ අනුව ගමනට ගත වූ කාලය සොයන්න.

i. පැය 1 යි මිනිත්තු 20 යි. ii. පැය 1 යි මිනිත්තු 35 යි. iii. පැය 2 යි මිනිත්තු 40 යි.

13. පහත රූපය ගැන නිවැරදි ප්‍රකාශය වන්නේ,



i. ත්‍රිකෝණ දහයක් වෘත්තයක් හා චතුරස්‍ර එකක් තිබෙයි.

ii. ත්‍රිකෝණ දෙකක් වෘත්ත දෙකක් හා චතුරස්‍ර එකක් තිබෙයි.

iii. වෘත්ත එකක් ත්‍රිකෝණ දෙකක් හා චතුරස්‍ර එකක් තිබෙයි.

14. සැම විටම සත්‍යවන ප්‍රකාශය තෝරන්න.

i. ත්‍රිකෝණයේ පාද තුනම සැම විටම සමානයි.

ii. ත්‍රිකෝණයට සැම විටම සමමිතික අක්ෂ තුනකි.

iii. ත්‍රිකෝණයක් සැම විටම පාද තුනම සමාන හෝ දිගම පාදයට වඩා අනෙක් පාද දෙකෙ දිගින් වැඩි විය යුත්තය.

15. i. සඳ දැක ගත හැක්කේ රාත්‍රියට පමණි.

ii. චන්ද්‍ර ග්‍රහණය සිදුවන්නේ අමාවක දිනයට පමණි.

iii. සූර්ය ග්‍රහණය සිදුවන්නේ අමාවක දිනයට පමණි.

**16 සහ 17 ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න.**

16.




i. 27 ii. 12 iii. 9

17. 8361 = 117 නම් 1010 = ?

i. 20 ii. 30 iii. 11

18. ක්‍රීඩා උත්සවයකට ළමුන් 100 දෙනෙක් සහභාගි විය. ඉන් ළමුන් 65 ක් තොප්පි දමා සිටියෝ ය. 48 දෙනෙක් කුඩ ඉහලාගෙන සිටියෝ ය. 10 දෙනෙක් තොප්පි හෝ කුඩ නොමැතිව සිටියෝ ය. එසේ නම් කුඩ හෝ තොප්පි දෙකම ළඟ ඇති ළමුන් ගණන සොයන්න.

i. 23 ii. 13 iii. 113

19. පහත දැක්වෙන රූප ලබා ගැනීමට සම චතුරස්‍රාකාර කඩදාසියක් කිහිප වරක් නමා එක් කතුරු පහරකින් කපා ගන්නා ලදී. එය නැමූ වාර ගණන වන්නේ,



i. 2 ii. 3 iii. 4

20. ප්‍රශ්න 20 කින් යුත් ප්‍රශ්න පත්‍රයක සෑම ප්‍රශ්නයකටම ලකුණු 5 ක් ලැබෙන අතර, වැරදි පිළිතුරක් සඳහා ලකුණු තුනක් අඩු කරනු ලබයි. ලකුණු 60 ක් ලබා ගැනීමට නිවැරදි විය යුතු ප්‍රශ්න ගණන තෝරන්න.

i. 10 ii. 15 iii. 18

**පහත රූප සටහන ඇසුරින් 21 සහ 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




21. මෙහි B අක්ෂරයට සුදුසු පිළිතුර වනුයේ,

i. 12 ii. 15 iii. 20

22. 45 නිරූපණ කිරීමට සුදුසු ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,

i. L ii. M iii. S

23. ගසක නිතරම තිබිය හැක්කේ,

i. මල් ii. අතු iii. මුල්

24. යනුල පොතක පිටු අංක 153 සිට 196 තෙක් කියවන ලදී. ඔහු කිය වූ පිටු ගණන වන්නේ,

i. 44 ii. 43 iii. 42

25.



ඉහත දැක්වෙන්නේ සම්පූර්ණයෙන්ම තීන්ත ආලේප කරන ලද ඝනකාභයකි. එය ඉරි දිගේ කපා වෙන් කර කුඩා ඝනකාභ කීයක් සාදා ගත හැකි ද?

i. 45 ii. 27 iii. 64

26. එහි එක් පැත්තකවත් තීන්ත නොගැවුණු කුඩා ඝනකාභ කීයක් තිබේද?

i. 3 ii. 6 iii. 8

27. නිවැරදිව ලියා ඇති වාක්‍ය තෝරන්න.

i. මම සමඟ අම්මා ගමට ගියා ය.

ii. අම්ම සමඟ මම ගමට යමු.

iii. මා සමඟ අම්මා ගමට ගියා ය.

28. යම් රටාවකට වචන ගලපා ඇත. මීළඟට ආ යුතු වචනය තෝරන්න.

ජයා → ජානු → ජැක් → ජෑම්

සග ජුවා සසග ජීනා සසසග ජිමි

29. 3412, 4520, 56 … …

i. 11 ii. 25 iii. 30

30.




ඉහත දැක්වෙන්නේ එක හා සමාන ටැංකි 5 කි. එහි එක් ටැංකියක් පිරීමට මිනිත්තු 10 ක් ගත වේ. නමුත් පළමු ටැංකිය පිරීම ආරම්භ කර එහි හරි අඩක් පිරෙන විට දෙවන ටැංකිය ද දෙවන ටැංකියෙන් හරි අඩක් පිරෙන විට තුන්වන ටැංකිය ද පිරීම ආරම්භ වේ. මෙලෙස ටැංකි පහ පිරීමට ගතවන කාලය සොයන්න.

i. මිනිත්තු 20 ii. මිනිත්තු 30 iii. මිනිත්තු 50

31. පහත සිදුවීම් අනුපිළිවෙලට පෙලගස්වන්න.



A B C D

i. A,B,D,C ii. A,C,D,B iii. A,C,B,D

32. මිත්තුල උදෑසන පාසල් යන විට ඔහුගේ වම් අත පහතට සෙවණැල්ල වැටී තිබුණි. පාසල පිහිටියේ ඔහු හැරී සිටින දිශාවත් ඔහුගේ සෙවනැල්ල වැටී තිබෙන දිශාවත් අතර මැද නම් පාසල පිහිටි දිශාව විය හැක්කේ,

i. ගිනිකොන ii. ඊසානදිග iii. වයඹ

33. පහත ප්‍රකාශවලට ගැළපෙන රූපය තෝරන්න.

- කොණ්ඩය මැදින් බෙදා ඇත.
- මුහුණ දිගටි නොවේ.
- ඇයගේ දකුණු අත පැත්තේ මුහුණේ ළපයකි.



i. ii. iii.

34. පහත දැක්වෙන්නේ සමාන බර ඇති දොඩම් ගෙඩි හතක් හා තරමක් බර වැඩි එක් දොඩම් ගෙඩියකි. තැටි තාරාදියක් භාවිතයෙන් බර වැඩි දොඩම් ගෙඩිය සොයා ගැනීමට කී වරක් තරාදිය භාවිතා කළ යුතු ද?



i. 8 ii. 3 iii. 2

35. පහත දැක්වෙන්නේ සමචතුරස්‍රාකාර කඩදාසියක් දෙවරක් නවා යම් කොටසක් ඉවත් කළ ආකාරයයි. එය දිග හැරිය විට ලැබෙන රූපය වන්නේ,





i. ii. iii.

36. පහත දැක්වෙන්නේ රන් දම්වැලකි. එහි ඕනෑම එක් පුරුකක් ගැලවීමට රුපියල් 500 ක් අය කරයි. මෙහි ඇති සියලුම පුරුක් ගැලවීමට උවමනා අවම මුදල සොයන්න.



i. රු. 3500.00 ii. රු. 3000.00 iii. රු. 1500.00

37. පහත රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.



රු. 70.00 රු. 80.00

 ක මිල කීය ද?

i. රු. 10.00 ii. රු. 20.00 iii. රු. 25.00

38. කොකිස් පහක සහ කැවුම් පහක මිළ සොයන්න.

i. රු. 150.00 ii. රු. 200.00 iii. රු. 175.00

39. 1 සිට අංක 9 තෙක් ඉලක්කම් යෙදූ කාඩ්පත් පහළොවක් ඇත. ඇතැම් ඉලක්කම් එක් වතාවකට වඩා යොදා තිබේ. එහි පළමු කාඩ්පත් පහේ අගය 15 නම් ඉතිරි කාඩ්පත් දහයේ තිබිය හැකි උපරිම අගය විය හැක්කේ.

i. 84 ii. 55 iii. 39

40. ශ්‍රමදානයක මිනිසුන් 91 දෙනෙක් සහභාගි විය. තේ පානයේ දී එක් අයෙකුට බනිස් ගෙඩිය බැගින් දීමට තීරණය කරන ලදී. එක් උරයක බනිස් දෙකක් තිබේ නම් සියලු දෙනාටම දීමට බනිස් උර කීයක් උවමනා වේද?

i. 91 ii. 45 iii. 46